# සාමාන්‍ය සමයේ විසිහයවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම නෙහෙමියා 2:1-8

නෙහෙමියාගේ පොතෙන් ගත් පාඨයෙකි.

"ඔබ සතුටු නම් මාගේ පියවරුන්ගේ නගරය ගොඩනඟනු පිණිස මා එහි යැව්ව මැනව."

දිනක් අර්තක්ෂස්තා රජුගේ විසිවන අවුරුද්දේ නිසාන් මාසයේ ඔහු ඉදිරිපිට මුද්‍රික පානය තිබෙද් දී මම මුද්‍රික පානය රැගෙන රජුට දිනිමි. මීට පෙර මම ඔහු ඉදිරියෙහි දී දුක්මුසු ව නොසිටියෙමි. එවිට රජු මට කතා කොට, "ඔබට අසනීපයක් නැති නමුත්, ඔබේ මුහුණ දුක්මුසු ව තිබෙන්නේ මන්ද? මෙය සිතේ කණගාටුවක් මිස වෙන කිසිවක් නොවේ ය"යි කීවේ ය.

එවිට මම ඉතා බියෙන් රජුට කතා කොට, "රජතුමා සඳහට ම ජීවත් වේවා! මාගේ පියවරුන්ගේ සොහොන් තිබෙන නගරය පාළු වී, එහි දොරටු ගින්නෙන් දැවී ගොස් තිබිය දී මාගේ මුහුණ දුක්මුසු නොවන්නේ කෙසේ දැ"යි කීමි.

එවිට රජතුමා කතා කොට, "ඔබ ඉල්ලා සිටින්නේ කුමක්දැ"යි මාගෙන් ඇසීය. එවිට, මම ස්වර්ගයේ දෙවියන් වහන්සේට යාච්ඤා කොට, "රජතුමා සතුටු නම්, ඔබේ දාසයා රජු ඉදිරියේ කරුණාව ලබා සිටී නම්, ජුදාහි මාගේ පියවරුන්ගේ සොහොනේ තිබෙන නගරය ගොඩනඟනු පිණිස මා එහි යැව්ව මැනවැ"යි කීමි.

රජ තෙම, බිසවත් තමා ළග වාඩිවී සිටිය දී කතා කොට, "ඔබේ ගමනට කොපමණ කල් ගත වේ ද," කියාත්, "ඔබ නැවත එන්නේ කවදා ද" කියාත් මාගෙන් ඇසීය. මම රජුට කාලයක් නියම කර කීවෙමි. රජ තුමා මා යවන්නට සතුටු විය.

ඇරත් මම රජුට කතා කොට, "රජ තුමා සතුටු නම්, මා ජුදයට පැමිණෙන තුරු රට මැදින් යන්නට දෙන ලෙස, එගොඩ සිටින දිශාධිපතීන්ට දීමට ලියුම් ද ගෘහයට අයිති කොටුවේ දොරටු වල බාල්කවලටත්, නුවර පවුරුවලත්, මා පදිංචි වන්නට යන නිවාසවලටත් ලී දෙන ලෙස රජුගේ මුකලාන භාරකාරයා වන ආසාප්ට දීමට ලියුමක් ද මට ලැබේවා"යි කීමි. මාගේ දෙවියන් වහන්සේගේ යහපත් හස්තය මා කෙරෙහි තිබුණු හෙයින් රජ තෙම එසේම මට දුන්නේය.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 137 : 1-6

පිළිතුර: විදේශයක දී සමිඳුන්ගේ ගීතය අපි කෙසේ ගයමු ද?

ගීය:

බබිලෝන්හි ගංතෙරවල අපි හිඳගතිමු.
සියොන් කන්ද අපට සිහි වූ විට අපි හඬා වැළපුණෙමු.
එහි බට පඳුරුවල අපේ වීණා එල්ලා තැබීමු.

එසේ කළේ වහල්කමට අප ගෙන ගිය අය ගැයුම් වැයුම් කරන ලෙස අපට බල කළ බැවිනි.
අපට පීඩා කළ අය සියොන් ගීයක් ගයා ඔවුන් විනෝද කරවන ලෙස අපෙන් ඉල්ලූ බැවිනි.

විදේශයක දී, සමිඳුන්ගේ ගීතය අපි කෙසේ ගයමු ද?
එම්බා ජෙරුසලම! තී මට අමතක වී නම්, මාගේ දකුණත වියළී යේවා! මා තී සිහි නොකරම් නම්, මාගේ පරමානන්දය මෙන් ජෙරුසලම මම නොසළකම් නම් මාගේ දිව ගොළු වේවා!

## සුසුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබවහන්සේගේ වචන මාගේ දපයට පහනක් ය.
මාගේ මාවතට එළියක් ය.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 9: 57-62

"ඔබවහන්සේ යන ඕනෑම තැනකට වුව ද සමිඳුනි, මමත් ඔබ අනුව එන්නෙමි."

ඔවුන් මග බැස යද්දී එක් මිනිසෙක් "ඔබවහන්සේ යන ඕනෑම තැනකට වුව ද මමත් ඔබ අනුව එන්නෙමි" යි කීය. ජේසුස් වහන්සේ කතා කොට "හිවලුන්ට බෙන ද අහසේ කුරුල්ලන්ට කැදලි ද ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට හිස තැබීමටවත් තැනක් නැතැ"යි ඔහුට වදාළ සේක. උන්වහන්සේ තව කෙනෙකුට "මා අනුව එන්නැ"යි වදාළ සේක. ඔහු "ස්වාමිනි, පළමුකොට මාගේ පියා භූමදාන කරන පිණිස යන්නට මට අවසර දුන මැනවැ"යි කීය. උන්වහන්සේ උත්තර දෙමින් "මළවුන්ගේ භූමදානය මළවුන් ම කළාවේ. ඔබ ගොස් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කරන්නැ"යි ඔහුට වදාළ සේක. තවත් කෙනෙක් "ස්වාමිනි, ඔබ අනුව එන්නෙමි. එහෙත් පළමු කොට මාගේ ගෙදර උදවියගෙන් සමුගෙන ඒමට අවසර දුන මැනවැ"යි කිය. ජේසුස් වහන්සේ "නගුලට අත තබා ආපසු බලන කිසිවෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට සුදුසු නැතැ"යි ඔහුට වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.